# වෙරළ ආරක්ෂිත දිය කඩනය හේතුවෙන් උණවටුන වෙරළට සිදු වී ඇති බලපෑම

ඩී. එච්. ඩී. හේවගේ*

2013 වර්ෂයේ lonely Planet ආයතනය විසින් ලොව හොඳම වෙරළ තීරය ලෙසත් "රන් වෙරළ" (Golden Beach) ලෙස මුළු ලොවම ආකර්ෂණය වූ උණවටුන වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත්ව ඉදි කළ ගල්වැටිය හේතුවෙන් උණවටුනෙහි සංචාරක ආකර්ෂණය අඩු වී ඇත. උණවටුන වෙරළ තීරය කරා සංචාරකයන් ගෙන්වා ගැනීමට නම් වෙරළ ආශ්‍රිතව දර්ශනීය බව මෙන් ම පාරිසරික සංරක්ෂණයන් කෙරෙහි යොමු වී වෙරළ තීරය භාවිතයට ගැනීමේ ක්‍රමවේදයන් සැකසීම ඉතා වැදගත් ය. උණවටුන වෙරළ තීරය නැවත සංචාරක පාරාදීසයක් කිරීමටත්, විධිමත් පාරිසරික සංරක්ෂණ ප්‍රතිපත්ති මගින් වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම සිද්ධි අධ්‍යයනයේදී ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයේ නියැලීම, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි හරහා දත්ත රැස් කිරීම හා ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යනයක් ද සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේදී උණවටුන වෙරළ තීරය ආශ්‍රිත වැදගත්කම හදුනාගනු ලැබිණි. වසර 40 කට වැඩි කාලයක සිට සංචාරකයන්ට සුවදායී ගමනාන්තයක් වූ මෙය වෙරළ ආශ්‍රිත ස්වාභාවික පිහිටීමටත් බොනවිස්ටා කොරල් පරය හා වෙරළ ඛාදනය වීම කෙරෙහි ගල් වැටිය සෘජුවම බලපෑම් කර ඇත. ඉතා සංවේදී බොනවිස්ටා කොරල් පරයත් ඒ ආශ්‍රිත ජෛව විවිධත්වයෙන් යුතු පරිසර පද්ධතිය බාදිත වැලිවලින් වැසීමේ අවදානම වැඩිය. ස්වාභාවික ආරක්ෂිත මුහුදු තටාකය අනතුරුදායක මුහුදු තටාකයක් බවට පත් ව ඇත. නැවත ගල් වැටියේ යම් ප්‍රමාණයක් ඉවත් කළ ද උණවටුන වෙරළ ඛාදනය තීව්‍ර වීම හේතුවෙන් නිරිත දිග වෙරළ තීරයේ සංචාරක වැදගත්කමටත්, සංචාරක කර්මාන්තයේ බිඳ වැටීමටත්, උණවටුන සංචාරක කර්මාන්තය හා බැදුණු සෘජු සහා වක්‍ර රැකියා දස දහසකට අධික පිරිසකට සිය ජීවන වෘත්තීන් ද අහිමිවීමේ අවදානමක් ඇත. පවතින වෙරළ නීතිය ක්‍රියාත්මක කර හිරු එළියෙන් නැහැවුණු වෙරළත්, නිසසල ජල තටාකයේ සිසිලස සංචාරකයා හට විඳ ගැනීමටත්, සංවේදී සාමුද්‍රික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනීමටත් ඒ තුළින් යළි සංචාරක පාරාදීසයක් කිරීමට දියකඩනය (ගල්වැටිය) මුළු මුනින්ම ඉවත් කිරීමත් බාදිත වෙරළ සකස් කිරීම කළ යුතු ය.

ප්‍රමුඛ පද - උණවටුන, වෙරළ තීරය, ගල් වැටිය, සංරක්ෂණය, සංචාරක කර්මාන්තය

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය hasankahewage071@gmail.com